# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,965- 2016 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2016.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 656 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 659 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 665 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 668 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 670 |

*සැ. යු.* - නිඩා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්'පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**නොපිරවූ මඟී ප්‍රවේශ පත්‍ර 36,900,000ක් ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක SRS/F.7345

ශ්‍රී ලංකාවේ කොළඹ තැ. පෙ. 355 ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා නොපිරවූ මාර්ග ප්‍රවේශ පත්‍ර 36,900,000ක් සැපයීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ. ලංසුකරුවන්ට තම ලංසු ශ්‍රී ලංකාවේ ලියාපදිංචි, පත්කළ හා නෛතික වශයෙන් සහසන් කළ ඇටර්නි බලපත්‍රයක් මඟින් බලය පැවරූ නියෝජිතයෙකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

2. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 2,500.00ක් හෝ සමාන ආදළ පරිවර්තනය කළ හැකි ශ්‍රී ලංකා විදේශ තානාපති කාර්යාලවල ප්‍රධානි විසින් තීරණය කරනු ලබන විදේශ මුදලකින් ගෙවීමෙන් 2016.04.07 දින සිට 2016.05.25 දින දක්වා, 1000 පැය හා 1500 පැය අතර, කාලය තුළ, ශ්‍රී ලංකාවේ, කොළඹ 10 ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් ලේඛන සහිත ආකෘතිපත්‍ර මඟින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

3. ලංසු භාරගැනීම 2016.05.26 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) 14.00 පැයට අවසන් කෙරේ. මුද්‍රා තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, අදළ අවසාන වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
තැ. පෙ. 355, ඕල්කොට් මාවත, කොළඹ.

ලියාපදිංචි තැපෑලෙන් ලංසු එවීමේ දී සිදුවිය හැකි ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හෝ දුම්රිය දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් දරන්නේ නැත.

4. අදළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ඉහත 03 ජේදය යටතේ සඳහන් ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයින්හට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

5. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කොට බැලිය හැක.

6. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අය ඇමතිය හැක.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක 94(11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.sls@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

යොමු අංකය : srs/f. 7345

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04- 1018

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ටොන් 10 ධාරිතාවයේ ට්‍රැක් ජැක් 60ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය ( Ratchet වර්ගය හා අතින් ක්‍රියාකරන පිනියන්)**

ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ටොන් 10 ධාරිතාවයේ ට්‍රැක් ජැක් 60 ක් (Ratchet) වර්ගය හා අතින් ක්‍රියාකරන පිනියන්) සැපයීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු භාර ගැනීම, 2016.06.29 වැනි දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කරනු ලැබේ.

3. ආපසු නොගෙවන ගාස්තු රුපියල් 3,000.00 හෝ නිදහසේ හුවමාරු කළ හැකි සමාන විදේශ මුදලින් ගෙවීමෙන්, 2016.06.28 වැනි දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) පස්වරු 3.00 දක්වා, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාලවලින් ලබාගත හැකි ආකෘති පත්‍ර මඟින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

4. අදළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

5. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

6. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි ය. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අය ඇමතිය හැක.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7329

04- 1001

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ට්‍රැක් බැලස්ට් (Track Ballast) කියුබ් 14,600ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

01. පහත සඳහන් ස්ථානයන්ට ට්‍රැක් බැලස්ට් සැපයීම සඳහා බත්තරමුල්ල, පියවර II සෙත්සිරිපාය, 7 වැනි මහලේ, ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2016.05.09 වැනි දින ප. ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි. මෙම ලංසු ඇගයීම් කර පහත සඳහන් එක් එක් අයිතමය වෙනුවෙන් වෙන වෙන ම ප්‍රදානය කරනු ලබයි.

| *අයිතම අංකය* | *ස්ථානය* | *කියුබ්* | *භාරදීමේ කාල සීමාවන්* |
|---|---|---|---|
| 01. | මඩකලපුව දුම්රිය අංගනය | 3,000 | මාස 10 |
| 02. | එරාවුර් අංගනය | 2,000 | මාස 08 |
| 03. | වාලච්චේනයි අංගනය | 2,000 | මාස 08 |
| 04. | මොරගොල්ලාගම අංගනය | 500 | මාස 04 |
| 05. | කලාවැව අංගනය | 500 | මාස 04 |
| 06. | කැකිරාව අංගනය | 1,000 | මාස 06 |
| 07. | ත්‍රිකුණාමලය අංගනය | 1000 | මාස 06 |
| 08. | චීන කොටුව අංගනය | 1000 | මාස 06 |
| 09. | තඹලගමුව අංගනය | 500 | මාස 04 |
| 10. | හිගුරක්ගොඩ අංගනය | 600 | මාස 04 |
| 11. | පොළොන්නරුව අංගනය | 1,000 | මාස 06 |
| 12. | මනම්පිටිය අංගනය | 500 | මාස 04 |
| 13. | වැලිකන්ද අංගනය | 500 | මාස 04 |
| 14. | පූනානි අංගනය | 500 | මාස 04 |

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ රු. 5,000.00 ක ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් 2016.05.06 දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල පමණි.

03. 2016.05.09 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, බත්තරමුල්ල, පියවර II සෙත්සිරිපායේ, 7 වැනි මහලේ, ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිත-යින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. මුද්‍රා තැබූ ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය,
7 වැනි මහල, සෙත්සිරිපාය,
පියවර 11, බත්තරමුල්ල.

6. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදු කළ හැකි ය.

දුරකථන අංක : 2438078, 2436818
ෆැක්ස් අංකය : 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

යොමු අංකය : SRS/F. 7308

04- 1000

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි (IFB)

**ද්විත්ව මාර්ග ඉදිකිරීම සඳහා මහනුවර සිට ගැටඹේ හරස් මග දක්වා මූලික බැලස්ට් (පිරවුම් ද්‍රව්‍ය) අතුරනය සැපයීම හා ස්ථානගත කිරීම, හැඩගැස්වීම එළිපෙහෙළි කිරීම, ගල් මුල් ඉවත් කොට සැකසීම, මතුපිට පස ඉවත් කිරීම පස් පිරවීම සහ සනවත් කිරීම ABC ඇතිරීම හා සනවත් කිරීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F 7350

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි සභාපති විසින් ද්විත්ව දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා, මහනුවර සිට ගැටඹේ දුම්රිය හරස් මග දක්වා මූලික බැලස්ට් ලේයර් සැපයීම හා ස්ථානගත කිරීම සහ හැඩගැස්වීම සැකසීම මග එළි පෙහෙළි කිරීම, ගල් මුල් ඉවත් කොට සැකසීම මතුපිට පස් ඉවත් කිරීම, පස් පිරවීම හා සනවත් කිරීම ABC ඇතිරීම හා සනවත් කිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබන අතර, එම ලංසු භාරගැනීම 2016.05.10 වැනි දින ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

ලංසු ආපසු ගෙවනු නොලබන රුපියල් 3,000.00 ක ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2016.05.09 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ඉදිරිපත් කළ යුතු ය.

02. ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලබන්නේ මහා මාර්ග ඉදිකිරීම් සහ වාරිමාර්ග හා ඉඩම අපවහන කේෂ්ත්‍රයේ C 4 ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි සඳහා ඉදිකිරීම් , අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි වී ඇති සහ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (NCCASL) හි සාමාජිකයින් වන අයවළුන් හට පමණි.

03. ලංසු ලිපිලේඛන කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී, ගාස්තු ගෙවීමකින් තොරව (නොමිලේ) පරීක්ෂාකර බැලිය හැකි ය.

04. ලංසු එම ලංසු භාරගන්නා අවසාන දින සිට අවම වශයෙන් දින එකසිය විස්සක (120) කාල පරිච්ඡේදයකට වලංගු විය යුතු ය.

05. සියලුම ලංසු සමග රුපියල් පන් ලක්ෂ පනස් දහසක් (රු. 550,000.00)ක් පමණක් වන වටිනාකමින් යුත්, ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතු ය.

06. මුද්‍රා තබන ලද ලංසු, එම ලංසු භාර ගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති වෙත ලියාපදිංචි (ලේඛනගත) තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

07. ලංසු, එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්ම වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි සභාපති තුමාගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට , ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට පැමිණ සිටිය හැකි ය.

08. වැඩිදුර විස්තර සඳහා කරුණාකර, දුරකථන අංක 2438078, හෝ 2436818 මගින් දුම්රිය ගබඩා අධිකාරි වෙතින් විමසනු මැනවි. ෆැක්ස් 2432044, ඊමේල් srs. s/@gmail.com වෙබ් අඩවය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.
යොමුව : SRS/F. 7350

04-1002

---

**මහාධිකරණය - මාතර**

මාතර මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද පහත සඳහන් කරනු ලබන රථ වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| *වාහන ලියාපදිංචි අංකය* | *වෙළඳ නාමය* | *වාහන වර්ගය* | *ඇප තැන්පතුව රු.* |
|---|---|---|---|
| 1. 42 - 9131 | ඉසුසු | ට්‍රක් රථය | 5000 |
| 2. 49 - 7289 | මෙසි ෆර්ගසන් | මහ ට්‍රැක්ටර් එන්ජිම | 5000 |
| 3. 45 ශ්‍රී 2928 | - | මහ ට්‍රැක්ටර් ටේලරය | 1,000 |
| 4. 47 - 3322 | ඉසුසු | ටිපර් රථය | 5,000 |
| 5. 48 - 9956 | ඉසුසු | ඩී ප්‍රිසර් ලොරි රථය | 5,000 |
| 6. SPGB 3861 | ඉසුසු | ටිපර් රථය | 5,000 |

පහත සඳහන් කරන ලද රථ වාහන විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් 2016 ජුනි 2 වැනි දින ප. ව. 2.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

1. සතියේ කාර්යාල දිනයන්හි පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා අදාළ අධිකරණ කාර්යාල භූමියේ දී මෙම වාහන පරීක්ෂා කළ හැකි ය.

2. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු ගාස්තුව ඉහතින් දක්වෙන පරිදි සහ ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු රු. 100 ක මුදල තැන්පත් කිරීමෙන් 2016 ජුනි 2 වැනි දින ප. ව. 12.00 දක්වා මාතර මහාධිකරණයෙන් ටෙන්ඩර් පත් ලබා ගත හැකි ය.

3. මුද්‍රා තබන ලද ටෙන්ඩර් 2016 ජුනි 2 වැනි දින ප. ව. 2.00 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි ය. ගෙනවත් බාර දෙන්නේ නම් කලාප ගණකාධිකාරී ඉදිරියේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකි ය.

4. ටෙන්ඩර් බහා එවන ලියුම් කවයේ උඩ වම් කෙළවරේ "වාහන සඳහා මිළ ගණන් 2016" යනුවෙන් සඳහන් කළ යුතු ය.

5. ටෙන්ඩර් විවෘත කිරීම 2016 ජුනි 2 වන දින ප. ව. 2.30 ට මාතර මහාධිකරණයේ දී සිදු කෙරේ. මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

6. සාර්ථක ලංසුකරුවන් විසින් දින 07 ඇතුළත ඉදිරිපත් කරන සම්පූර්ණ මුදල ගෙවා වාහන රැගෙන යා යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වුවහොත් ආපසු ගෙවන තැන්පතුව අහිමි කරනු ලැබේ.

7. අනුමත ආකෘති පත්‍රයෙන් තොරව විස්තර සඳහන් ප්‍රකාශනයේ කොන්දේසි ප්‍රකාරව නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ සඳහා කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

8. එක් ටෙන්ඩර් පත්‍රයක් මගින් මිළ ගණන් ඉදිරිපත් කළ හැක්කේ එක් වාහනයක් සඳහා පමණි.

9. ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් ස්වකීය කෙටි අත්සන යෙදිය යුතු ය.

10. ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඇමිනිය යුතු ය.

11. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

දමිත් තොටවත්ත,
මහාධිකරණ විනිසුරු - මාතර.

2016 අප්‍රේල් මස 08 වැනි දින,
මාතර මහාධිකරණයේ දී ය.

04-970

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - මතුගම**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද සහ නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2016.05.14 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙරවරු 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මතුගම.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මතුගම මහෙස්ත්‍රාත් අධිකරණ වෙන්දේසි ලේඛනය 2016**

| | නඩු අංකය | භාණ්ඩ වර්ගය/භාණ්ඩ වර්ග |
|---|---|---|
| 1. | 1966 | පොරව තල 01 |
| 2. | 2855 | මයික්‍රොමැක්ස් වර්ගයේ ජංගම දුරකථනයක් |
| 3. | 2888 | ජංගම දුරකථනයක් |
| 4. | 3231 | ෆෝමී වර්ගයේ ජංගම දුරකථනයක් |
| 5. | 4278 | කම්බි කුරු කිහිපයක් සහිත පාසැල් බෑගයක් |
| 6. | 4537 | යකඩ මිටි 1 |
| 7. | 4537 | කළු පැහැ ජංගම දුරකථනයක් |
| 8. | 4537 | බෝර කටුවක් |
| 9. | 5363 | බාල්දි 3 |
| 10. | 5667 | පොරව 01 |
| 11. | 6037 | පොරව 01 |
| 12. | 7649 | පොරව 01 |
| 13. | 8226 | බෝල මිටි 01, යකඩ කුරු 01 |
| 14. | 8301 | පොරව 01 |
| 15. | 8889 | බාල්දි 2 |
| 16. | 9561 | පොරව 1 |
| 17. | 9595 | පාපැදි 01 |
| 18. | 11187 | පොරව 01 |
| 19. | 11618 | වක් පිහියක් |
| 20. | 11918 | පිහි 01 |
| 21. | 12265 | පොරව තල 01 |
| 22. | 12266 | පොරව 01 |
| 23. | 12494 | පිහි 01 |
| 24. | 12929 | පොරව 01 |
| 25. | 13182 | වැලි කුඩ 02 |
| 26. | 13296 | පොරව 1 |
| 27. | 13589 | පිහි 1 |
| 28. | 13590 | පොරව තල 01 |
| 29. | 13591 | පොරව 01 |
| 30. | 13592 | පොරව තල 01 |
| 31. | 13597 | පොරව 01 |
| 32. | 13804 | වක් පිහියක් |
| 33. | 13804 | පොරව තල 01 |
| 34. | 13952 | පිහි 01 |
| 35. | 13953 | පොරව 01 |
| 36. | 14018 | උදළු 01 |
| 37. | 14075 | කැති 01 |
| 38. | 14183 | පිහි 01 |
| 39. | 14621 | පොරව තල 02 |
| 40. | 15986 | කළු පැහැ ඩු වර්ගයේ ජංගම දුරකථනයක් |
| 41. | 16266 | පිහි 01 |
| 42. | 16267 | පිහි 01 |
| 43. | 16521 | පිහි 01 |
| 44. | 16714 | පිහි 01, අලවංගු 01 |
| 45. | 16814 | පිහි 01 |
| 46. | 16815 | පොරව තල 01 |
| 47. | 16817 | පොරව තල 01 |
| 48. | 17062 | පොරව තල 01 |
| 49. | 17418 | කුඩා ජර්සි 10, කුඩා ටී ෂර්ට් 12 |
| 50. | 17607 | පොරව 01 |
| 51. | 17610 | පොරව 01 |
| 52. | 17920 | තරාදියක් |
| 53. | 18285 | කැති 1 |
| 54. | 18358 | බන්ඩි කියත් 1 |
| 55. | 18986 | බන්ඩි කියත් 1 |
| 56. | 19485 | හිස් කළු කාන්තා බෑගයක් |
| 57. | 19563 | ජී වින් වර්ගයේ බැට්‍රි රහිත කළු නිල් ජංගම දුරකථනයක් |
| 58. | 19774 | නිල් පාට ගෑස් 02 |
| 59. | 22613 | පොරව 01 |
| 60. | 22613 | කැති 01 |
| 61. | 22613 | පිහි 01 |
| 62. | 23060 | අත් කියත් 02 |
| 63. | 23983 | පිහි 01 |
| 64. | 24280 | විල්බැරෝ 1 |
| 65. | 24280 | සවල් 1, උදළු 1 |
| 66. | 25809 | සවල් 02 |
| 67. | 27467 | සෙරෙප්පු අඩංගු පාර්සල් 1 |
| 68. | 32051 | ඔට්ටපාලු කවරයක් |
| 69. | 38432 | කැති 01 |
| 70. | 42747 | (BR 569/09) නොකියා ජංගම දුරකථනයක් |
| 71. | 52263 | රබර රොටි කිහිපයක් |
| 72. | 59659 | ඔට්ටපාලු කවර 1 |
| 73. | 60206 | සවල් 1 |
| 74. | 61159 | නොකියා ජංගම දුරකථනයක් |
| 75. | 62485 | පිහි 01 |
| 76. | 66399 | කඹ කම්බි කිහිපයක් |
| 77. | 66582 | ජංගම දුරකථන 2ක් සහිත මුද්‍රා පාර්සලයක් |
| 78. | 66926 | ඔට්ටපාලු කවර 1 |
| 79. | 67891 | ලීපෝන් ජංගම දුරකථනයක් |
| 80. | 68025 | ඔට්ටපාලු කවර 1 |
| 81. | 68435 | මෝට්‍රෝලා වර්ගයේ ජංගම දුරකථනයක් |
| 82. | 69128 | ඔට්ටපාලු කවර 1 |
| 83. | 71406 | පිහි 01 |
| 84. | 72554 | රබර් රොටි මිටි 1 |
| 85. | 72582 | තඹ කම්බි කිහිපයක් |
| 86. | 73602 | ඔට්ටපාලු කවර 1 |
| 87. | 73666 | නොකියා ජංගම දුරකථනයක් |
| 88. | 73840 | රු. 220 ක සහ ඩිස්ප්ලේ බිඳුණු ඇල්ෆටෙල් ජංගම දුරකථනයක් |
| 89. | 74234 | ඔට්ටපාලු කවර 1 |
| 90. | 79899 | රබර් රොටි මිටි 1 |
| 91. | 81034 | රබර් රොටි සහිත කවර 1 |
| 92. | 82290 | සෙරෙප්පු 2 |
| 93. | 82533 | නොකියා ජංගම දුරකථනයක් |
| 94. | 82780 | ඔට්ටපාලු කවර 1 |
| 95. | 83207 | ජංගම දුරකථන 2ක් |
| 96. | 83231 | පොරව 01 |
| 97. | 83640 | ඔට්ටපාලු කවර 1 |
| 98. | 84197 | පොරව 1 |
| 99. | 84421 | බර්ඩ් වර්ගයේ පියන රහිත ජංගම දුරකථනයක් |
| 100. | 87675 | ඔට්ටපාලු කවර 1 |

| | නඩු අංකය | භාණ්ඩ වර්ගය/භාණ්ඩ වර්ග |
|---|---|---|
| 101. | 88098 | කම්බි රෝල් 03යි |
| 102. | 88395 | ඔට්ටපාලු කවර 1 |
| 103. | 88397 | රබර් රොටි සහිත කහ පාට කවර 1 |
| 104. | 90233 | පාසැල් බෑගයක් |
| 105. | 90296 | සවල් 01 |
| 106. | 90505 | සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථනයක් |
| 107. | 92132 | රබර් රොටි මිටි 1 |
| 108. | 93426 | වයර් සහ කම්බි කිහිපයක් |
| 109. | 94933 | යකඩ බට 1 |
| 110. | 95833 | සුදු ලොකු පිහි 2 |
| 111. | 97482 | කලු ජංගම දුරකථනයක් |
| 112. | 97482 | NOKIA වර්ගයේ ජංගම දුරකථනයක් |
| 113. | 98858 | ස්කයි වර්ගයේ ජංගම දුරකථනයක් |
| 114. | 99500 | මහින්ද්‍රා වර්ගයේ බල්බ් පෙට්ටි 10 |
| 115. | 99611 | කැති 01 |
| 116. | 104/14 | පිහි 01 |
| 117. | 1450/09 | ඩීසල් කෑන් 1 (49836) |
| 118. | 484/13 | පාපැදි 01 |
| 119. | 67/14 | පොරව 01 |
| 120. | 6736/14 | තඹ කම්බි අඩංගු කවරයක් |
| 121. | 68105/10 | ගෑස් සිලින්ඩර් 01යි, කැඩීගිය ෆෑන් 01, ප්ලාස්ටික් පුටු 4යි, පිඟන් රාක්කයක්, ඇන්ටනා කොටසක්, ගල් වංගෙඩි 01යි, මිරිස් ගලක්, ප්ලාස්ටික් මේසයක් |
| 122. | AR 1095/14 | පොඩි ටයිල් 39 |
| 123. | AR 1096/14 | පාපැදි 09 |
| 124. | AR 1505/10 | ගිල්විය හැකි වතුර මෝටර් 1 |
| 125. | AR 151/14 | පාපැදි 01 |
| 126. | AR 152/14 | පාපැදි 03 |
| 127. | AR 153/14 | පාපැදි 01 |
| 128. | AR 155/14 | පාපැදි 01 |
| 129. | AR 156/14 | පාපැද 01 |
| 130. | AR 1624/13 | පාපැදි 01 |
| 131. | AR 1625/13 | පාපැදි 01 |
| 132. | AR 1627/13 | පාපැදි 01 |
| 133. | AR 2507/11 | නොකියා ජංගම දුරකථනයක් |
| 134. | AR 2678/12 | ජංගම දුරකථනයක් |
| 135. | AR 349/14 | පාපැදි 01 |
| 136. | AR 751/14 | පාපැදි 01 |
| 137. | BR 1469/05 | මෝට්‍රෝලා වර්ගයේ ජංගම දුරකථනයක් |
| 138. | 5380 | කහ පාට ගෑස් 01 (PR 75/14) |
| 139. | AR 486/14 | ඩයිමන් රෝලක කොටස් කිහිපයක් |
| 140. | අංක රහිත | බාල්දි 35 |
| 141. | අංක රහිත | ට්‍රන්ක පෙට්ටි 3 |
| 142. | අංක රහිත | ඇළුමිනියම් කල 5 |
| 143. | අංක රහිත | උදළු 30 |
| 144. | අංක රහිත | උදළු තල 4 |
| 145. | අංක රහිත | කුළු ගෙඩි 2 |
| 146. | අංක රහිත | යකඩ දැල් කොටස් කිහිපයක් |
| 147. | අංක රහිත | පොරව 7 |

| | නඩු අංකය | භාණ්ඩ වර්ගය/භාණ්ඩ වර්ග |
|---|---|---|
| 148. | අංක රහිත | යතු කැට 3 |
| 149. | අංක රහිත | පැදුරු 3 |
| 150. | අංක රහිත | කම්බි රෝල් කොටස් 1 |
| 151. | අංක රහිත | බැට්‍රි 03 |
| 152. | අංක රහිත | සවල් 15 |
| 153. | අංක රහිත | ඔට්ටපාලු කවර 22 |
| 154. | අංක රහිත | වාහන රෝදයක කප් 01 |
| 155. | අංක රහිත | කැති තල 03 |
| 156. | අංක රහිත | ඇතිලි 16 |
| 157. | අංක රහිත | කියත් නොහොරි 3 |
| 158. | අංක රහිත | අලවංගු |
| 159. | අංක රහිත | බන්ඩි කියත් 8 |
| 160. | අංක රහිත | පොල් කවර 15 |
| 161. | අංක රහිත | පාපැදි 95 |
| 162. | අංක රහිත | ලොකු ඇලුමිනියම් මුට්ටි 05 |
| 163. | අංක රහිත | පොඩි ඇලුමිනියම් මුට්ටි 04 |
| 164. | අංක රහිත | ඔරු 02 |
| 165. | අංක රහිත | බාර්ත් ටැබ් 01 |
| 166. | අංක රහිත | ගැල්වනයිස් බට 05යි |
| 167. | අංක රහිත | ලී රාක්කයක් |
| 168. | අංක රහිත | කටු කම්බි රෝල් 3ක් |
| 169. | අංක රහිත | වාහනයක රිම් කොටසක් |
| 170. | අංක රහිත | මහන මැෂින් 01යි |
| 171. | අංක රහිත | ඩේට්‍රෝන් වර්ගයේ ටී වී යන්ත්‍රයක් |
| 172. | අංක රහිත | පැනසොනික් වර්ගයේ කැසට් යන්ත්‍ර 03ක් |
| 173. | අංක රහිත | අබලන් කැසට් යන්ත්‍රයක් |
| 174. | අංක රහිත | කුඩා කැසට් යන්ත්‍ර 01යි |
| 175. | අංක රහිත | කොස්මෝ වර්ගයේ ටීවී 01යි |
| 176. | අංක රහිත | ලොකු බැටරියක් |
| 177. | අංක රහිත | ෂෝට් කලිසම් 24යි |
| 178. | අංක රහිත | වෙල්වට් කාපට් 01යි |
| 179. | අංක රහිත | හෙල්මට් 02යි |
| 180. | අංක රහිත | බිත්ති ඔරලෝසු 01යි |
| 181. | අංක රහිත | ගෑස් කුකර් 02යි |
| 182. | අංක රහිත | යකඩ ඇදක් |
| 183. | අංක රහිත | ලොකු යකඩ තාච්චි 01 |

මතුගම මහෙස්ත්‍රාත් අධිකරණ කාර්යාලය තුළ පවතින කැඩී බිඳී ඇති සෑදීමට නොහැකි පහත සඳහන් භාණ්ඩ ද ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා සූදානම් කොට ඇත.

| | | |
|---|---|---|
| 184. | අංක රහිත | කාර් රථයේ ටයර් 2 |
| 185. | අංක රහිත | ටයිප් රයිටර් 04යි |
| 186. | අංක රහිත | ලී රාක්කයක් |
| 187. | අංක රහිත | වානේ කබඩ් 03යි |

04-974

**දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - පුත්තලම**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා නඩු අංක සොයාගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවල හා පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණය මගින් පවත්වනු ලබන කල්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදළව හා 2016.01.01 වැනි දිනට පෙර මෙම අධිකරණය මගින් මෙහෙයවනු ලැබූ ආණමඩුව සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයට අදළව මෙම අධිකරණය වෙත භාර දී ඇති නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, නඩු අංක සොයාගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද යතුරු පැදි 2016 ජුනි මස 04 වැනි සෙනසුරාදා දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කළ හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදිනම පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

බන්ධුල ගුණරත්න,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
පුත්තලම.

2016 අප්‍රේල් මස 06 වැනි දින,
පුත්තලම දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *ලි. ප. අංකය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *වර්ගය* |
|---|---|---|---|---|---|
| 01. | BR 1548/10 | MT 1864 | LLCLXJ3C761B70178 | LC147FMFXD090758 | Loncin LX 90 - 3 C වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 02. | 43585/10 | - | LZSPCJLOX51910665 | ZS156FMI15970420 | ZONGSHEN 125 වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |
| 03. | BR 1362/09 | - | MD2DDDUZZTWF14557 | DUMBPF66363 | Bajaj CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 04. | 22857/08 | - | HA02-2222652 | HA02E-2109416 | HONDA SUPER CUB 90 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 05. | 30224/08 | - | RMCOM90F46000030 | RM147FMF06070109 | Ranomoto custom 90 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 06. | 30045/K | - | HA02 - 2006355 | - | Honda custom 90 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | ලි. ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | වර්ගය |
|---|---|---|---|---|---|
| 07. | BR 96/11 | - | LHJPCBLA780060259 | IP39FMBO8069259 | Honta HT 48Q වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 08. | 63976 | - | - | YX147FMD02040424 | Daido වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 09. | 43286 | - | CEYM0648A6100111C | CEYM0648A1640106E | Ceygra CG 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 10. | BR 1732 | 125 - 9686 | V 50 - 664797 | V 50 - 664797 | Yamaha mate 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 11. | අංක රහිත | - | - | - | Yamaha News Mate වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 12. | AR 642/13 - | | V 50 - 7182372 | V 50 - 7122372 | Yamaha mate 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 13. | අංක රහිත | 89-7951 | C 50 - 6270579 | C 50E - 6274397 | Honda C 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 14. | අංක රහිත | - | V 50 - 883631 | - | Yamaha Mate 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 15. | AR 1097/11 | - | CD 125T - 1211789 | CD 125TE - 1106984 | Honda CD 125 T වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 16. | අංක රහිත | | CD 125T - 1303622 | CD 125TE - 1220807 | Honda 125 T වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 17. | අංක රහිත | | 97K19F00569 | 97K17E00428 | Hero Honda Splender වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 18. | අංක රහිත | 129 -8320 | CM125T - 1009330 | CM125TE - 1009338 | Honda CM 125 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 19. | 24677 | - | CD 125T - 1009668 | CD 125TE - 1006358 | Honda CD 125 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 20. | BR 1355/11 | - | LAAAXKFB3A00030 69295942 | JLIP47FMF-510A | Jialing JL 90 - A වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | ලි. ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | වර්ගය |
|---|---|---|---|---|---|
| 21. | 34206/09 | - | C 50 -5020858 | C50E - 102385 | Honda C 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 22. | 30698/K | - | LLCLXL3C441B08326 | - | Road Master RM 90 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 23. | AR 121/10 | - | DSVBLL27690 | DSGBLL28824 | Bajaj Discovery වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 24. | AR 1468/11 | - | MD625AF1731N87305 | OFIN31075672 | TVS Victor GL වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 25. | BR823/07 | - | 2JL- 001749 | - | Yamaha වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 26. | AR 122/12 | - | DJVBEJ79043 | DJGBEJ74442 | Bajaj Pulsar 180 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 27. | 10803/15 | NW XK 3815 | ME154B021B2 009448 | 54B2009290 | Yamaha SZ වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 28. | අංක රහිත | NW GW - 4357 | DDFBJK03383 | DDMBJK88511 | Bajaj Caliber වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 29. | 81530/13 | - | - | IP 50FMG106545380 | Lifan වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 30. | අංක රහිත | - | C 50 - 0523725 | C 50 E - 0523796 | Honda C 50 වර්ගයේ ලියපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 31. | 50958 | - | C 50 - 3327783 | CF50E - 3302240 | Honda C 50 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 32. | BR 1572/12 | NW JW 4604 | LZPPCGL0743086558 | 150FMG - I -05000217 | Honsan FD 100-4 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 33. | 44902 | - | DUFBNA90794 | DUMBHA01644 | Bajaj CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | ලි. ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | වර්ගය |
|---|---|---|---|---|---|
| 34. | අංක රහිත | - | V 80-5333106 | V80-5333106 | Yamaha mate 50 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 35. | AR 1508/13 | NW HM 8605 | LLCLXJ3C831B60545 | LC147FMFB0385241 | Loncin Custom LX 90 - 3C වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 36. | 47060 | 128 - 1312 | V 90T - 281707 | V90T - 281707 | Yamaha V90 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 37. | AR1508/13 | - | 3WW -057855 | 3WW - 057855 | MBK Booster වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 38. | AR644/13 | - | V50-044284 | V50 - 044284 | Yamaha mate 50 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අබලි යතුරු පැදිය |
| 39. | AR 1508/13 | NW UW 4255 | LLCLXA10781100303 | LC139FMAVA084748 | Loncin lX 48 Q වර්ගයේ ලියාපදිංචි කළ හැකි යතුරු පැදිය |

04-967

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

රා තැබෑරුම් රේන්ද විකිණීම (2016/2017 වර්ෂය) - 2016 ජූලි මස සිට 2017 ජූනි මස දක්වා

2016 ජූලි මස 01 වැනි දින සිට 2017 ජූනි මස 30 වැනි දින දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ................................ දරන ................................ රා තැබෑරුම සඳහා" යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2016.05.16 වැනි දින පෙ. ව. 10.30 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2016.05.16 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2016.06.06 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්(වැ. බ.),
කල්පිටිය.

2016 අප්‍රේල් මස 07 වැනි දින,
කල්පිටිය,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම | ටෙන්ඩර් පත්‍රය භාරගන්නා අන්තිම දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2016.05.16 වැනි දින පෙ. ව. 10.30 | 1,000 0 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2016.05.16 වැනි දින පෙ. ව. 10.30 | 1,000 0 |

04-989

---

**මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය**

**රා තැබෑරුම් රේන්ද විකිණීම** - (2016/2017 වර්ෂය) 2016 ජූලි මස 01 සිට 2017 ජූනි මස 30 දක්වා කාලය සඳහා

2016 ජූලි මස 01 වැනි දින සිට 2017 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක.................................... දරන.......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2016.05.24 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2016.05.24 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම නැවත විකිණීම 2016.06.14 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංක : 032-2052271).

ඒ. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මුන්දලම.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2016.05.24<br>පෙ.ව. 10.30 | 1,000 0 |
| 02. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව.11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව.8.00 | 2016.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 03. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00<br>ප.ව.5.00 | ප.ව.2.00<br>ප.ව.8.00 | 2016.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 04. | මුන්දලම | උඩප්පුව | පෙ.ව.11.00<br>ප.ව.5.00 | ප.ව.2.00<br>ප.ව.8.00 | 2016.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |

05-1017

---

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016/2017 වර්ෂය

**2016 ජූලි මස 01 සිට 2017 ජුනි මස 30 දක්වා**

2016 ජූලි මස 01 දින සිට 2017 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ''අංක........................... දරන................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2016.05.13 දින පෙ.ව.10.30 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2016.05.13 වැනි දින පෙ.ව.10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2016.06.03 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අදල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

එස්. පී. වීරසේකර,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2016 ක් වූ අප්‍රේල් මස 07 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පුත්තලම.

***උපලේඛනය***

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>රාත්‍රී 8.00 | 2016.05.13<br>පෙ.ව. 10.30 | 1,000 |

04-968

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ස්පීඩ් ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111738
ලියාපදිංචි කාර්යාලය : අංක 52, ගුණවර්ධන මාවත, කොළඹ 06
ලියාපදිංචි කළ දිනය : 2016 පෙබරවාරි 08

සමාගමේ ලේකම්වරු.

04-973

## දැන්වීමයි

සමාගමේ නම : සිවෙක්රා (Sivekra) කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 76469
ලිපිනය : අංක 214, දෙහිපේ
සංස්ථාගත කළ දිනය : 2011.01.10

ක. දි. වා. මු. ර හපුහින්න,
අධ්‍යක්ෂක.

04-1022

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : සී පී වර්ල්ඩ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 112703 - 2016.03.28
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අදියර 6, ඇක්සෙස් ටවර් අංක 278, යුනියන් පෙදෙස, කොළඹ 2.

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

2016 මාර්තු මස 31 වැනි දින,
අංක 45,
බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

04-975

**සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : ට්‍රොපිකල් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 112424 - 2016.03.17
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 104, පාගොඩ පාර, පිටකෝට්ටේ.

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

04-977

**ස්වෙච්ඡාවෙන් ඈවර කිරීමේ යෝජනාව පිළිබඳව දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත 320 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමු.

සාමාජිකයින්ගේ ස්වෙච්ඡාවෙන් ගණන් බේරා ඈවර කිරීමේ විශේෂ යෝජනාවක් සමාගම විසින් සම්මත කර ඇත.

යෝජනාවේ දිනය : 2016 පෙබරවාරි 03
සමාගමේ නම : සීමාසහිත වීඩියෝ වෝල් පුද්ගලික සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 67532
ලියාපදිංචි ලිපිනය : අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.

එල්. ඩබ්. ඩී. අබේරත්න මහතා,
අධ්‍යක්ෂක.

04-1008

---

**වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරණු ලබන ප්‍රසිද්ධ දැන්වීම**

සමාගමේ නම : රිමැක්මා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 112098
සංස්ථාගත කළ දිනය : 2016.02.24
ලියාපදිංචි ලිපිනය : අංක 237/3ඒ/3, මිතුරු මාවත, දිවුල්පිටිය, බොරලැස්ගමුව, කොළඹ, ශ්‍රී ලංකා.

ආර්. ඒ. සී. කාංචනා රණතුංග,
සමාගම් ලේකම්.

04-978

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාර දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලැබූ ඒකාබද්ධ කිරීමේ සහතිකය අනුව, 2016 පෙබරවාරි මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උක්ත පනතෙහි 242 (1) වගන්තිය යටතේ ප්‍රයොරිටි ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම යුනිෆැෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කොට ඇති බැව් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කරනු ලැබූ සමාගමේ නම : යුනිෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ කරනු ලැබූ සමාගමෙහි ලියාපදිංචි ලිපිනය : අංක 107, හුනුපිටිය ලේක් පාර, කොළඹ 02
ඒකාබද්ධ කරනු ලැබූ දිනය : 2016 පෙබරවාරි 29 වැනි දින
සමාගමෙහි ලියාපදිංචි අංකය : පී වී 15252

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

යුනිෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2016 මාර්තු මස 02 වැනි දින.

04-976

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගම්පොල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොල නගර සභා සීමාවන් තුළ කීරපන ගමේ ගම්පොල නාවලපිටිය මහාමාර්ගයේ ගම්පොල නගර මධ්‍යයට ඉතා නුදුරුව පිහිටි හුණුගේකුඹුර දැන් වත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. ආර්. ටී. බී. රත්නායක විසින් 1991.03.13 වැනි දින සාදන ලද අංක 388 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 3.2

මෙම දේපළ සෙම්බුකුට්ටි ආරච්චිගේ සමන්ත ප්‍රදීප් ද සිල්වා බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - ගම්පොල නගර මධ්‍යයේ සිට නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ මීටර් 750ක් පමණ බෝක්කු අංක 1/5 පසුකර මීටර් 50ක් පමණ ගිය විට අදළ දේපළ මෙම පාරට මායිම්ව දකුණු පසින් පිහිටා තිබේ.

2016ක් වූ මැයි මස 24 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2011.01.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2011.01.25 වැනි දින ඩේලිමිරර්, ලක්බිම සහ තිනකරන් පවුත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකාර තැන (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011- 2661826, 011- 26618, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.

දුරකථන අංකය : 081 - 2210595/ 071- 4755974/071-8446374/077-7761706.

04-987

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දෙමහල් නිවසක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ රාජගිරිය ඔබේසේකරපුර නානායක්කාර මාවත තුළ ගෝතමී ගාඩින්ස්හි පිහිටි තුඩුවේකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එස්. ලෝකනාතන් විසින් 1999.12.02 වැනි දින සාදන ලද අංක 4748/1998 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 5 ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නානායක්කාර මාවත වරිපනම් අංක 181 ඒ 37 සහ 181ඒ 57/1/1 දේපළ ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 7.75.

*දේපළට පිවිසීම.* - බොරැල්ල සිට දොස්තර එන්. එම්. පෙරේරා මාවත ඔස්සේ රාජගිරිය දෙසට ගෝතමී මාවත දක්වා ගමන් ගෙන වමට හැරී එම මාවතේ හමුවන පාලම පසුකර බෝ ගහ දක්වා පැමිණ දකුණට හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන නැවත වමට හැරී කාසන්ස් කුලී වාහන සේවය ( Casons Rent a Car Office) කාර්යාලය දක්වා පැමිණ වමට හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන දකුණට හැරී මීටර් 15ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ වී 2 ප්‍රොපටි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2016ක් වූ මැයි මස 20 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.08.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.09.05 වැනි දින ලක්බිම, ඩේලිමිරර්, හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකාර තැන (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011- 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.

දුරකථන අංකය : 081 - 2210595/ 071- 4755974/071-8446374.

04-988

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.